# රට ගොඩනැඟීමට මහ සඟරුවනට විශාල දායකත්වයක් ලබාදිය හැකියි

## - ඇමැති මිලින්ද මොරගොඩ

යුද්ධයෙන් පසුව උදා වී ඇති අනගි අවස්ථාවෙන් රට ගොඩනැගීම සඳහා ආගමික නායකයන්ගෙන් ලැබෙන උපදෙස් හා අනුශාසනා ඉතා වැදගත් බව එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කොළඹ දිස්ත්‍රික් අපේක්ෂක අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ ඇමැති මිලින්ද මොරගොඩ මහතා පවසයි.

ඇමැතිවරයා මේ අදහස් පල කලේ මහා සංඝරත්නය සමග පාදුක්ක ගලගෙදර ගුණවර්ධනාරාම විහාරස්ථානයේ ඉකුත් 26 වැනිදා පැවති සංවාදශීලී හමුවකදීය.

එහි දී තවදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද පැවසීය.

'තිස් වසරක යුද්ධයෙන් පසු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් ආර්ථිකය හා සමාජය ගොඩනැගීමට හොඳ අවස්ථාවක් උදා වී තිබෙනවා. ඒ සඳහා විශේෂයෙන් භික්ෂූන් වහන්සේලාට විශාල දායකත්වයක් ලබාදිය හැකියි.

ඒ සඳහා ආගමික ස්ථානවල දායකත්වය රජයට අවශ්‍යයි. ආර්ථිකය පමණක් සංවර්ධනය වීමෙන් සමාජය යහපත් වන්නේ නැහැ. ආර්ථික සංවර්ධනය සමාජ සංවර්ධනයත් සමග ඉදිරියට යා යුතුයි. ඒ සඳහා සිවිල් සමාජය හා විහාරස්ථානය අතර සම්බන්ධතාවය ඇති විය යුතුය.

පළමුව අවශ්‍ය වන්නේ පුද්ගලයා සංවර්ධනයයි. එසේ වූ විට සමාජ සංවර්ධනයත් ඇති වෙනවා. යුද්ධය හේතුවෙන් රටක් වශයෙන් අප අභියෝග රැසකට මුහුණ දුන්නා. රටේ බොහෝ කටයුතු අඩපණ වුණා. කුරිරු යුද්ධය අවසන් ව ඇති බැවින් යළි නව යුගයකට යාමේ අවස්ථාව උදා වී තිබෙනවා. ඒ සඳහා සියලු ක්ෂේත්‍ර නව මාවතකට පැමිණිය යුතුයි. විශේෂයෙන් එහි දී අපේ රටේ දේශපාලනය ක්‍රමවේදය වෙනස් විය යුතුයි. අද අවශ්‍ය වන්නේ ප්‍රතිරූප දේශපාලනය නොව ප්‍රතිපත්ති දේශපාලනයයි. වර්තමානයේ රටේ පවතින්නේ ගෝත්‍රවාදී දේශපාලන රටාවක්. කැපුවත් කොළ හා නිල් යන සංකල්ප වෙනස් විය යුතුයි. ඒ සඳහා ආගමික ස්ථාන මගින් සිවිල් සමාජයට මගපෙන්විය යුතුයි.



මෙහි දී ප්‍රදේශයේ මහා සංඝරත්නය සමග ඇමැතිවරයා පවතින ගැටලු හා අදහස් පිළිබඳ සාකච්ඡා කලේ ය.

මේ අවස්ථාවට පොකුණුවිට රාජමහා විහාරාධිපති ගොඩිගම වතරතන, තල්දේනි ඥාණිස්සර යන නා හිමිවරුන් ප්‍රධාන මහා සංඝරත්නය ද ශ්‍රී ලංකා ජාතික සංගමයේ මහලේකම් ආර්. ඒ. ඩී. සිරිසේන මහතා ද විහාරස්ථානයේ දායක සභාවේ නිලධාරීන් හා දහම් පාසලේ ආචාර්ය මණ්ඩලය ද එක්ව සිටියහ.